**ජල සම්පත් මණ්ඩලය - 2019**

**------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ජල සම්පත් මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන

## 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

## 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලයේ අවසන් තොගය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 9 අනුව පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයමත වටිනාකම යන දෙකෙන් අඩු අගයට පෙන්නුම් කළ යුතු වුවද භාවිතයෙන් ඉවත්කර තිබුණු යන්ත්‍රවලට අදාල රු.මිලියන 4.31 ක් වූ | විදුම් යන්ත්‍ර මණ්ඩලය වෙත ලැබීමේදී ඒ සමග ලැබුණු අමතර කොටස් වන අතර ඒවා වෙළෙඳපලේ සුලභව නොමැති හෙයින් ශුද්ධ උපලබ්ධි අගයන් ගණනය කිරීම අසීරු වී ඇත. තවද මෙම අමතර කොටස් එම යන්ත්‍ර භාවිතා කිරීමට තබා ගනු ලබන ඒවාද වේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අමතර කොටස් තොගයෙහි ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමකින් තොරව එහි පිරිවැය මත අගය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |
| (ආ) | ඉකුත් වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් ලෙස සමාලෝචිත වර්ෂය තුළදී ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට රු. මිලියන 3.13 ක ගැලපීම් සිදුකර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව එම ගැලපීම් අතීතානුයෝගීව ගලපා ඉකුත් වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රතිෂ්ඨාපනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර අදාළ ගැලපීම්වල විස්තර අනාවරණය කරද නොතිබුණි. | 2020 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී ප්‍රතිෂ්ඨාපනය කරන ලද (RESTATED) ප්‍රකාශන ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලය ආරම්භ කිරීම සඳහා රජයේ ප්‍රාග්ධනය සම්පාදනය කර දී තිබුණු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 ට අනුව රජයෙන් ලබා දී තිබුණු අදාළ ප්‍රාග්ධන දායකය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර ඒ වෙනුවට සමුච්චිත අරමුදල (Accumulated Fund) ලෙස රු. මිලියන 256 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | රජයෙන් ලබා දී තිබුණු ප්‍රාග්ධන දායකය 2020 වර්ෂයේ සිට රජයේ ප්‍රදාන ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිත වලට අනුගත විය යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 03 කට පෙර පිරිවැය රු. මිලියන 5.8 ක් වූ විදුම් යන්ත්‍ර 06 ක් භාවිතයෙන් ඉවත් කර තිබුණද එම යන්ත්‍රවල වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු නොකර යන්ත්‍ර හා උපකරණ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | විගණනය විසින් පෙන්වාදී ඇති විදුම් යන්ත්‍ර 6 න් 3 ක් අපහරණය කිරීමට ගාල් කර ඇති අතර අනෙක් විදුම් යන්ත්‍ර 03 අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් රත්මලාන වැඩපල වෙත භාර දී ඇත. | භාවිතයෙන් ඉවත් කරන ලද වත්කම්වල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණු නළ ළිං 03 ක වටිනාකම වූ රු.මිලියන 4.98 ක් සමාලෝචිත වර්ෂයේදී ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ නිරාකරණය වූ නළ ළිං 3 එම වර්ෂයේද ඉන්වොයිස් කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව අනුමත කරන ලද කොන්ත්‍රාත්වල වටිනාකම නිවැරදිව ගිණුම්වල ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැති ශේෂ වටිනාකම වූ රු.20,502,733 කින් රු.7,603,424 ක් වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ වූ අතර එම ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂයකට වඩා පැරණි ණයගැති ශේෂයන් නිරවුල් කිරීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී. | ණය ශේෂ අයකර ගැනීම යාවත්කාලීනව සිදු කළ යුතුය. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පුද්ගලයින් හා ආයතන 96 කින් විවිධ සේවාවන් ඉටු කිරීම සඳහා ලැබුණු රු.14,174,980 ක් වූ සේවා අත්තිකාරම්වලින් රු.179,626 ක් වර්ෂයක කාලයක් ඉක්ම වී තිබුණු අතර අදාළ කාර්යයන් ඉටුකර දීමට 2019 දෙසැම්බර් 31 දින වන විටද මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | විවිධ සේවාවන් ඉටු කිරීම සඳහා ලබා ගත් අත්තිකාරම් නිරවුල් කිරීමට අවධානය යොමු කර ඇති අතර, 2019 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වඩා කල් ගතවූ වූ රු.179,626,000 ක ශේෂයද නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | අදාළ කාර්යයන් නිම කර ඇති අත්තිකාරම් අදායම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 | ඉකුත් වර්ෂයේ සිට පැවත එන රු.118,000 ක් වූ තොග ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කර නොතිබුණි. | | තොග ඌණතාවයක් ලෙස පවතින රු.118,000 ක ශේෂය පිළිබඳව විමර්ෂණ කටයුතු මේ වන විට බොහෝ දුරට අවසන් වී ඇති බැවින් මෙම වර්ෂයේදී එය නිරවුල් කිරීමට අපේක්ෂා කරනු ලැබේ. | ඌනතා සම්බන්ධව මුදල් රෙගුලාසි 104 ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය | (i) | කෘෂිකාර්මික කටයුතු සඳහා ඉදි කරනු ලබන විෂ්කම්භය මීටර් 4 ක් හෝ ඊට වැඩි වගා ළිං, වානිජමය කෘෂිකාර්මික කටයුතු සහ කර්මාන්ත අවශ්‍යතා සඳහා ඉදි කරනු ලබන නළ ළිං සඳහා ජල සම්පත් මණ්ඩලයේ | එකඟ වෙමි. අංක 2010/23 සහ 2017 මාර්තු 16 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුකූලව භූ ගත ජලය ලබා ගැනීම සහ ඒ සඳහා ගැඹුරු නළ ළිං ඉදිකිරීම නියාමනය කිරීමේ මූලික කටයුතු එම වර්ෂයේදීම ආරම්භ කරන ලද අතර ඒ අනුව නළ ළිං ඉදි කරනු ලබන බාහිර ආයතන ලියාපදිංචි කිරීම, ඉදිකිරීම් වලට ප්‍රථම භූ විද්‍යාත්මක | අංක 2010/23 හා 2017 මාර්තු 16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තවද නළ ළිං ඉදිකරන සියළු ආයතන මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු වුවත් ඇතැම් ආයතන එසේ ලියාපදිංචි වී නොතිබුණි. | පරීක්ෂණ සිදුකර අදාල වාර්තා ජල සම්පත් මණ්ඩලය වෙත ඉදිරිපත් කොට අවශ්‍ය අනුමැතිය ලබාදීම, තාක්ෂණික දත්ත ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන දත්ත ගබඩාව වෙත ලබා ගැනීම ඇතුළු මූලික පියවරයන් සිදු කරන ලදී. තවද මේ පිළිබඳව නියාමන කටයුතු සිදු කිරීමේදී විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු තරයේ සලකා බලන ලද අතර හඳුන්වා දී ඇති නියාමන උපමාන තවදුරටත් විධිමත් කිරීම සඳහා ක්‍රියා මාර්ග ගෙන ඇත. |
| (ii) | වාණිජමය කෘෂිකර්මාන්තය සඳහා හෝ කර්මාන්ත සඳහා මසකට ලීටර් 30,000 ක භූගත ජලය ලබා ගන්නා සියළුම ව්‍යාපෘති සඳහා අදාළ ජල ප්‍රභවය සම්බන්ධ තත්ත්ව වාර්තා නිකුත් කර නොතිබුණි. | |
| (iii) | ගැසට් පත්‍රයේ 3 වගන්තිය ප්‍රකාරව අදාළ විශ්ලේෂණ වාර්තා අනුමැතිය සඳහා ජල සම්පත් මණ්ඩලය වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | |
| (iv) | ගැසට් නිවේදනයේ 2 වගන්නිය අනුව දෛනිකව ලබාගන්නා ජල පරිමාණයන් පිළිබඳ දත්තයන් පවත්වාගත යුතු වුවත් ඇතැම් | |

පෞද්ගලික
ආයතනයන් එසේ
කටයුතු කර
නොතිබුණු අතර
ඒ සම්බන්ධයෙන්
මණ්ඩලය කිසිදු
නීතිමය
ක්‍රියාමාර්ගයක්
ගෙන
නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.41,201,000 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 33,658,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,543,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉකුත් වර්ෂයේ ආදායමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.54,992,000 කින් අඩු වී තිබුණද ඊට සාපේක්ෂව වර්ෂයේ වියදම ඉකුත් වර්ෂයට වඩා රු. 62,545,000 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවනතා විශ්ලේෂණය

-------------------------------------------------------------------

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී වෙනත් මෙහෙයුම් වියදම් රු.35,251,000 කින් අඩු වී තිබුණු අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 84.76 ක අගයක් ගෙන තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

------------------------

| අනුපාත වර්ගය | 2019 | 2018 |
|---|---|---|
| ද්‍රවශීලතා අනුපාතය | | |
| ජංගම අනුපාතය | 11.06 | 6.25:1 |
| ක්ෂණික අනුපාතය | 5.48 | 3.16:1 |

මණ්ඩලය විසින් එහි මෙහෙයුම් කටයුතු වල ස්වභාවය අනුව තිබිය යුතු සුදුසු කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය පිළිබඳ ඇගයීමක් කර සුදුසු කාරක ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ දී ජංගම වගකීම් 1 ක් පියවීම සඳහා ජංගම වත්කම් 11.06 ක් පවත්වාගෙන තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජල සම්පත් මණ්ඩලයට අයත් වාහන 30 ක් සඳහා වාහන ලුහුබැඳීමේ යන්ත්‍ර සපයා සවි කිරීම සඳහා රු. මිලියන 1.419ක වටිනාකමකට 2019 සැප්තැම්බර් 18 දින ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ප්‍රකාරව අදාළ යන්ත්‍ර 2019 ඔක්තෝබර් 02 වන දින වන විට සවි කළ යුතුව තිබුණද 2020 ජූනි 18 දින වන විටත් අදාළ පිරිවිතරයන්ට අනුකූලව සවිකිරීම් සිදුකර නොතිබුණි. කොන්ත්‍රාත්කරු ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් 2020 ජූනි 20 දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එකඟ වෙමි. මෙම වාහන ලුහුබැඳීමේ යන්ත්‍ර සවි කල ආයතනය සඳහා මේවන විට කිසිදු ගෙවීමක් සිදු කර නොමැති අතරමොරටුව විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික් දැනුම උපදේශණය යටතේ කටයුතු කිරීමට සැලසුම් කර ඇත. | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු ලවා අදාළ කාර්යය ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරියට අයත් ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල භූමිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් රත්මලාන යාන්ත්‍රික වැඩපල පිහිටි භූමිය හා අලුත්නුවර ප්‍රාදේශීය ලේකම්ට අයත් අනුරාධපුර අලුත්නුවර පිහිටි සංචාරක නිවාසය අයත් භූමිය ජල සම්පත් මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ජල සම්පත් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල භූමිය රජයට අයත් ඉඩමක් වන අතර තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් ජල සම්පත් මණ්ඩල කාර්යාල භූමිය පැවරීමට නොහැකි බවත් කෙටිකාලින බදු පදනම මත ලබා දිය හැකි බව දන්වා ඇත. රත්මලාන යාන්ත්‍රික වැඩබිම පවතින ඉඩම ඇතුළුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිල නිවාස සමූහයද නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස ව්‍යාපෘතියක් සඳහා තෝරාගෙන ඇති බැවින් ඊට විකල්ප ඉඩමක් ලබා දෙන | පවරා නොගත් වත්කම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | බව දන්වා ඇත. අනුරාධපුර සංචාරක නිවාසය පිහිටි ඉඩම දිගුකාලින බදු පදනම මත ජල සම්පත් මණ්ඩලයට ලබා දීමට ගැසට් කර ඇත. | |
| (ඇ) | ජල සම්පත් මණ්ඩලයේ පලාත් බල ප්‍රදේශය තුළ ජල සම්පත් මණ්ඩලයේ අනුමැතිය යටතේ ඉදිකරන ලද ළිං සම්බන්ධයෙන් එම ළිංවල පිහිටි ප්‍රදේශය පැහැදිළිව හඳුනාගත හැකිවන පරිදි (GPS) ඛණ්ඩාංක ඇතුළත් සිතියමක් පලාත් කාර්යාල තුළ ස්ථාපිත කර නොතිබුණු අතර එම ළිං පිළිබඳව තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි. | එකග වෙමි.<br>පුත්තලම පළාත් කාර්යාලය වෙත එම බල ප්‍රදේශයට අදාල නළ ළිං සම්බන්ධයෙන් පැහැදිලිව හඳුනාගත හැකි පරිදි පරිගණක ආශ්‍රිතව සිතියම් සකස් කිරීමටද පොදුවේ පරිශීලනය කිරීමට හැකි පරිදි අදාල දත්ත ජල සම්පත් මණ්ඩලයේ වෙබ් අඩවියට ලබා දීමටද හැකිතාක් දුරට කාර්යාල පරිශ්‍රයේ ප්‍රදර්ශණය කිරීමටද උපදෙස් ලබා දුන් අතර ජල සම්පත් මණ්ඩලය සතු සීමිත භූ විද්‍යාඥ නිලධාරීන් හා තාක්ෂණික නිලධාරීන් හේතු කොට ගෙන යම්තාක් දුරට මෙම කටයුතු ප්‍රමාද විය හැක. | ජල සම්පත් මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතු ළිං පිහිටි ප්‍රදේශ පැහැදිළිව හඳුනාගත හැකි පරිදි GPS ඛණ්ඩාංක ඇතුළත් සිතියමක් පලාත් කාර්යාල තුළ ස්ථාපිත කර ළිං පිළිබද තොරතුරු ඇතුලත් දත්ත පවත්වා ගත යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මණ්ඩලය විසින් රු.මිලියන 2.640 කට මිලදීගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 11 ක් හා රු.මිලියන 2,250 කට මිලටගෙන තිබුණු විදුලි ජනක යන්ත්‍ර 03 ක් වර්ෂ තුනකට වැඩි කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ රඳවා ගෙන තිබුණි. තවද, එම යන්ත්‍ර වල වගකීම් කාලය ද අවසන්වී තිබුණු අතර එම යන්ත්‍ර භාවිතයට ගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | එකඟ වෙමි.<br>විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි දැනට භාවිතයට නොගෙන රත්මලාන ගබඩාවෙහි පවතින විදුලි ජනක යන්ත්‍ර හා ජල පොම්ප පසුගිය ගංවතුර අපදා සමයේ ද ඉන් පෙර පැවති අපදා තත්වයන්හිදී ද මණ්ඩලය වෙත හදිසි ආපදා කටයුතු සඳහා ලබා දී ඇති අතර ඒවායේ මූලික වටිනාකම් තක්සේරු කර අමාත්‍යාංශයේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ජල සම්පත් මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් යුක්ත කමිටුවක් මඟින් ප්‍රයෝජනයට ගත හැකි වෙනත් ආයතනයන්ට පැවරීමටද, ක්‍රියා විරහිත භාණ්ඩ අපහරණය කිරීමටද කටයුතු යොදනු ලැබේ. | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනයට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් 2017 වර්ෂයේ මැයි මස 31 දින ජල සම්පත් මණ්ඩලයේ භාවිතය සඳහා ජල පොම්ප 50 ක් රු.මිලියන 8.94 කට මිලදී ගෙන තිබුණි. එහි වගකීම් කාලය වර්ෂ 02 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ජල මෝටර් 50 න් 06 ක් පමණක් භාවිතය සඳහා යොදාගෙන තිබුණි. ජල පොම්ප 44 ක වගකීම් කාලය භාවිතයකින් තොරව ගබඩාවේදීම ඉකුත් වී තිබුණු අතර එම යන්ත්‍ර භාවිතය පිළිබඳව විකල්ප ක්‍රියාමාර්ගයකට එළඹ නොතිබුණි. එසේම 2009 වර්ෂයේ දී සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු අඟල් 1 ½ ජල පොම්ප 50 ක් භාවිතා කිරීමකින් තොරව සහ එම යන්ත්‍රවල සක්‍රීය බව හෝ අක්‍රීය බව පරීක්ෂා කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගබඩාවේ නිශ්කාර්යව රඳවාගෙන තිබුණි. | එකඟ වෙමි.<br>විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි දැනට භාවිතයට නොගෙන රත්මලාන ගබඩාවෙහි පවතින විදුලි ජනක යන්ත්‍ර හා ජල පොම්ප පසුගිය ගංවතුර අපදා සමයේ ද ඉන් පෙර පැවති අපදා තත්වයන්හිදීද මණ්ඩලය වෙත හදිසි ආපදා කටයුතු සඳහා ලබා දී ඇති අතර ඒවායේ මූලික වටිනාකම් තක්සේරු කර අමාත්‍යාංශයේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ජල සම්පත් මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් යුක්ත කමිටුවක් මඟින් ප්‍රයෝජනයට ගත හැකි වෙනත් ආයතනයන්ට පැවරීමටද, ක්‍රියා විරහිත භාණ්ඩ අපහරණය කිරීමටද කටයුතු යොදනු ලැබේ. | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනයට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලය සතුව භාවිතයට ගත හැකි විදුම් යන්ත්‍ර කිහිපයක් නිෂ්කාර්යව ගබඩා කර තිබියදී සහ 2016 වර්ෂය සමග සැසඳීමේදී නළ ළිං ඉදිකිරීමේ කටයුතුවල පහළ යාමක් තිබියදී, එම තත්ත්වය පිළිබඳ නොසළකා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රු.මිලියන 280 ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී නව විදුම් යන්ත්‍රයක් හා උපකරණ මිලට ගෙන තිබුණි. එම විදුම් යන්ත්‍රයද මිලට ගත් දින සිට මාස 08 පමණ කාලයක් නිෂ්කාර්යව තිබුණි. | ජල සම්පත් මණ්ඩලයේ පවතින විදුම් යන්ත්‍ර සූත්‍ර වැඩි ප්‍රමාණයක් ඉතා පැරණිවීමත් නිතර විශාල මුදල් පිරිවැයක් දරමින් පවත්වාගෙන යාමට සිදුවීමත් ආදී කරුණු වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීම මත මෙම රු.මිලියන 280ක් වටිනා නව විදුම් යන්ත්‍රය ජල සම්පත් මණ්ඩලය වෙත ලබා දී ඇත. 2019 මාර්තු මාසයේ උක්ත විදුම් යන්ත්‍රය ලැබුනද තාක්ෂණික ශක්‍යතාවය තහවුරු කිරීම, ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීම, ලියාපදිංචි කටයුතු අවසන් කිරීම ආදී කටයුතු නිසා ප්‍රයෝජනයට ගැනීම ප්‍රමාද විය. | වත්කම් උපරිම ඵලදායීතාවයෙන් යුතුව හා කාර්යක්ෂමතාවයෙන් යුතුව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) පුත්තලම ජල පරීක්ෂණාගාරය තුළ ස්ථාපිත කර තිබුණු ක්ෂුද්‍ර ජීව විද්‍යා රසායනාගාරය තුළ (Microbiology Laboratory) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය මගින් ලබා දී තිබූ රසායනාගාර උපකරණ වර්ග 05 කට අයත් ඒකක 06 ක් වසර 06 කට අධික කාලයක සිට රසායනාගාරය තුළ නිෂ්කාර්යව පැවති අතර අදාළ රසායනාගාරය මගින් 2014 දෙසැම්බර් සිට රසායනාගාර වාර්තා නිකුත් කර නොතිබුණි. | මෙම කාල වකවානුවේදී ක්ෂුද්‍ර ජීව පරීක්ෂණ සඳහා සේවා දායකයන්ගේ ඉල්ලුම ඉතා අවම මට්ටමක පැවතුණ අතර ක්ෂුද්‍ර ජීවී පරීක්ෂණ සඳහා රසායණික පරීක්ෂණ සිදු කිරීමට ස්ථිර ජල විශ්ලේෂකවරයෙක් නොසිටින ලදී. කෙසේ වුවද මෙම උපකරණ ක්‍රියාකාරී තත්ත්වයේ පවත්වාගෙන යාමට අවශ්‍ය නඩත්තු කටයුතු සිදු කළ අතර අවශ්‍ය කාර්යමණ්ඩලය බඳවාගන්නා තෙක් අනුරාධපුර පලාත් කාර්යාලයේ ඉදිකර ඇති නව රසායනාගාර සංකීර්ණය වෙත උපකරණ භාරදීමට තීරණය කර ඇත. | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු 64 ක් සඳහා සේවකයින් 413 දෙනෙකු අනුමත කර තිබුණද ඉන් තනතුරු 46 ක සේවකයින් 140 ක් පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු වර්ෂ කිහිපයක සිට පැවතියද 2020 ජූනි මස වන විටත් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර 2019 ජනාධිපතිවරණය හා 2020 පාර්ලිමේන්තු මැතිවරණය නිසා බඳවා ගැනීම් අත්හිටුවා ඇත. | විධිමත් බඳවාගැනීම් පරිපාටි අනුගමනය කරමින් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය අනුව ජල සම්පත් මණ්ඩලය විසින් ලගා කර ගත යුතු තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන තිබුණ ද, ඒ හා සම්බන්ධවන ඉලක්ක, | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූලව ජල සම්පත් මණ්ඩලය විසින් ලඟා කරගත් අරමුණු ප්‍රධාන වශයෙන් භූගත ජල සම්පත් දීප ව්‍යාප්තව සංවර්ධනය කිරීම, සංරක්ෂණය සහ කළමනාකරණය සහතික කිරීම පදනම් වූ අතර, පසුගිය | තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒ හා සම්බන්ධ ඉලක්ක, දත්ත ඉලක්ක ලගා විය යුතු සංසිද්ධි මැන බලන දර්ශක නිවැරදිව හඳුනා |

| | | | |
|---|---|---|---|
| | පාදක දත්ත, ඉලක්කය ලඟා විය යුතු සංධිස්ථාන මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශක ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂයන්හි මණ්ඩලයේ අත්දැකීම් සහ ඒ සම්බන්ධ ඉලක්ක පාදක දත්ත හා ප්‍රගතිය මැන බැලීමට අදාළ අතර මැදි ඉලක්ක මෙන්ම, ප්‍රධාන ප්‍රගති දර්ශක (KPI) ද, මණ්ඩලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් වලට ඇතුළත් කොට ඒ අනුව අදාළ ව්‍යාපෘති සිදුකරගෙන යනු ලැබේ.මෙම කටයුතු තවදුරටත් විධිමත් කිරීමට විගණනය මඟින් පෙන්වා ඇති පරිදි කටයුතු කරනු ලැබේ. මේ සඳහා අත්‍යවශ්‍ය භෞතික සහ මානව සම්පත් සපුරාගැනීමටද ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජල සම්පත් මණ්ඩලයේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් ලෙස පරිසර අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යන පාර්ශවයන් හඳුනාගෙන තිබුණ ද ආයතනයට අදාල ඉලක්ක පිළියෙල කිරීමේදි සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපනය නොවන බව වැඩි දුරටත් නිරීක්ෂණය විය. | මණ්ඩලයේ කාර්යභාරය හා සම්බන්ධ පරිසර අමාත්‍යාංශය, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ අනෙකුත් අදාල පාර්ශවයන් සමඟ මණ්ඩලය නිරතුරුවම කටයුතු කරන අතර, මණ්ඩලයේ කාර්යභාරය සැලසුම් කිරීමේදී විශේෂයෙන්ම වාරිමාර්ග හා ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් ලබාදෙන උපමාණ වලට අනුකූලව කටයුතු යොදනු ලැබේ. තවද, ජල සම්පත් මණ්ඩල පනතට අනුකූලව අවශ්‍ය රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය පිණිස යෝජිත අන්තර් දෙපාර්තමේන්තු උපදේශක කමිටු 2017 වසරේ සිට රැස් කිරීමට කටයුතු යොදා ඇත. | තිරසාර සංවර්ධනය උදෙසා සහභාගීත්ව ප්‍රවේශය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත | විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව දැඩිව අවධානය යොමු කොට අවශ්‍ය | තිරසාර සංවර්ධනය සඳහා ලඟා වීමට අදාළ වන දත්ත |

පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, භෞතික පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ පුහුණු සේවකයන් නොවීම යන කරුණු හේතු වී ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

යටිතල පහසුකම් වැඩිදියුණු කරනු ලැබේ. මීට අදාලව දිගුකාලීන සැලසුම් සකස් කිරීමට කටයුතු යොදනු ලැබේ.

එක්රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම කළ යුතුය.